# හොඳ සිංහල 5

මම හොඳ සිංහල ලියමි. එය විධිමත් ව එළි දැක්වීම සඳහා තවත් කීපදෙනෙක් වෙහෙසෙති. අනෙක් ලිපි වලට නැති අවධානයකින් එය කරනු ලබන්නේ එක් වචනයක් හෝ සදොස් ලෙස පළ වීමෙන් දුහුනන් දුෂ්කරතාවට පත් විය හැකි බැවිනි. එසේ එළි දකින මෙම පාඩමින් ඔබ නිසි පල ලබද්දැයි අපි නොදනිමු. එහි නොපැහැදිලි තැන් වේ ද? ගැට සහිත තැන් වේ ද? අපි ඒ ගැන කිසිවක් නොදනිමු. එහෙයින් ගැටලු ඇතොත් නොමැළි ව - නොපැකිළ අප විමසන ලෙසත් කෘතඥතා පූර්වක ව ඉල්ලමු.

අප පසු ගිය පාඩම අවසන් කෙළේ ප්‍රාර්ථන ආඛ්‍යාතය සහිත වැකි වල උක්තය යෙදෙන සැටි උගනිමිනි. සමහර පැරණි වියරණ පොත් වල එය හැඳින්වෙන්නේ ආශිර්වාද ක්‍රියාව නමිනි. “උඹ මක බෑවෙයං“ (උඹ මග බෑ වේවා - යන වැකියේ “බෑවෙයං“ යන පදයේ තේරුම නොපැහැදිලි නම් “දරුවා ඇඳේ බාවනවා“ “මං අද උඹ බාවනවා“ වැනි කියමන් තේරුම් ගන්න) “මට ගුඩු දුන්නට තොට හෙණ ගහපිය“ (ගුඩු කෙළිය) යන කියමන් ආශිර්වාද නොවේ. එනිසා “ප්‍රාර්ථනාඛ්‍යාතය“ යන නම එයට හොඳින් ගැලපේ. අද අපි එතැනින් පටන් ගම්මු.

**2.11 කර්ම කාරක වාක්‍යයක උක්තය බවට පෙරලෙන කර්ම පදය**

නයා මීයකු ගිලී
බල්ලා සාවකු මරයි යන වැකි දෙකෙහි ඇත්තේ කර්තෘ, කර්මය, ආඛ්‍යාතය යන පද තුනයි. මේ සැබෑ සිදුවීම් ලෙස සලකා දෑස් පියා ගෙන ඒවා සිතින්) නරඹන්න. එහිදී මීයාට වන්නේ කිමෙක් ද? මීයා ගිලෙන සැටිත් සාවා මැරෙන සැටිත් ඔබට පෙනෙනු ඇත. මෙහි කර්ම පද දෙකම අනියම් අරුතින් යෙදී ඇත. උක්තය ද අනියම් අරතින් යෙදුවහොත්
නයෙක් මීයකු ගිලී
බල්ලෙක් සාවකු මරයි යනුවෙන් ඒවා වෙනස් වේ. (උක්තය) කර්තෘ අනුක්ත වන විටත් කර්මය උක්ත වන විටත් නියම්/අනියම් අරුත නොවනස් ව තැබීම අත්‍යවශ්‍ය ය. ඒ අනුව නයෙක්/බල්ලෙක් යන පද නයකු/බල්ලකු වන අතර මීයකු/සාවකු යන පද මීයෙක්/ සාවෙක් වේ.

කර්ම කාරකයේ දී කර්මය උක්ත වේ.
මීයෙක් ගිලේ.
සාවෙක් මැරේ. යනු අර්ථවත් සම්පූර්ණ වැකි දෙකකි. වැඩි විස්තර සඳහා කෙස් ද? කොහිදී ද? කවදා ද? යන ප්‍රශ්න වලට ද උත්තර සැපයීම අවශ්‍ය වූ විටක කෙසේ ද? යන ප්‍රශ්නයට මෙහි දී අපට උත්තර සැපයිය හැකි ය.

නයකු විසින් මීයෙක් ගිලේ
බල්ලකු විසින් සාවෙක් මැරේ. යනුවෙනි එවිට එම දෙ වැකිය සම්පූර්ණ වන්නේ. මෙම දෙවැකියේ කර්ම උක්ත පද දෙක උක්ත රූප බවට පත් වී ඇති සැටි තේරුම් ගන්න. කර්ම කාරකය ගැන වැඩි විස්තර පසුව උගනිමු.

**2.12 “යුතු“ යන්නෙන් සැදුණු යුත්තේ ය, යුත්තෝ ය, යුත්තා හ යන පද සහිත වාක්‍ය වල කර්තෘ පදය**

### සිංහල ඉගෙන ගන්නට කැමති සැමට සන්නස සේවාවකි මේ

දැන් “දියණිය“ යනුවෙන් සමහර ලේඛකයන් ලියනු පෙනේ. පිළිගත් වියරණ විදියට අනුව “ආණ“ “අණි“ “අණු“ ප්‍රත්‍ය එක් වූ පද නිත්‍ය බහු වචන විය යුතු ය. ව්‍යවහාරය ගරු කළ යුතු වුවත් පුතණුවා මයිලණුවා මුත්තණුවා - පියාණ සිටාණ වෙළඳාණ වැනි ඒක වචන නාම පද සාදා ගත නොහැකි ය



වි. ක. ධර්මබන්ධු

ගුරුවරු ආදර්ශවත් වි යුත්තෝ ය/යුත්තා හ.
කිසිවෙක් රාත්‍රියෙහි මේ මඟින් නො යා යුත්තේ ය.
පයින් යන්නෝ මෙ තැනින් පාර හරහා යා යුත්තෝ ය.

මෙය ගැටලු සහිත තැනකි. “යුත්තෝ ය“ “යුත්තේ ය“ යන නාම ක්‍රියා රූපය නිසා කර්තෘ උක්ත රූපයෙන් යෙදෙතත් අතීත කාලය සඳහාත් ස්ත්‍රීලිංග පද සඳහාත් මේ ක්‍රමය භාවිතා කිරීම අපහසු ය. එනිසා ඒ ගැන අනුක්ත රූපය පාඩමේ දී උගනිමු. මෙබඳු වැකි ලිවීමෙන් වැලකීම මැනවැයි සිතමි.

**(නාම පදයක්) අනුක්ත රූප ගන්නා තැන්**

1 වාක්‍යයක කර්මය වශයෙන් යෙදෙන නාම පද

- හාමුදුරුවෝ දායකයින් අමතති.
- දියණියෝ මෑණියන් සනසති.
- මෑණියෝ දියණියන් සනසති. *(දැන් දියණිය යනුවෙන් සමහර ලේඛකයන් ලියනු පෙනේ. පිළිගත් වියරණ විදියට අනුව “ආණ“ “අණි ““අණු“ ප්‍රත්‍ය එක් වූ පද නිත්‍ය බහු වචන විය යුතු ය. ව්‍යවහාරය ගරු කළ යුතු වුවත් පුතණුවා, මයිලණුවා, මුත්තණුවා, - පියාණ, සිටාණ, වෙළඳාණ වැනි ඒක වචන නාම පද සාදා ගත නොහැකි බව සිහි තබා ගන්න)*
- ගැහැනියක් මැහැල්ලක නාවයි.
- බළලෙක් මීයකු මරයි.
- ඔහු මා නොහඳුනයි./නොහඳුනති.
- හේ අප ලුහු බඳී.
- බිලිඳෝ බිතෙහි රේඛාවක් අඳිති.

**2 ඇතැම් නිපාත සමග යෙදෙන නාම පද**

- තිරිසනුන් **වැනි** මිනිස්සු ආගමේ නාමයෙන් ළදරුවන් මරති.
- මෙය කාන්තාවන් **සඳහා** වෙන් කෙරුණු මැදිරියකි.
- ළමයින් **උදෙසා** ලියවුණු බොහෝ ඉංගිරිසි පොත් වේ.
- ඇය පන්සෙලේ දී හැසුරුණේ පිස්සියක **මෙනි.**
- මා **කරා** එව. මම ඔබ සුවපත් කරමි.
- පියාණනි අප **හා** උරණ නුවුව මැනවි.
- තම මව **වෙත** දුවන පැටියකු සේ ඔහු මා වෙත දිව ආ ය.
- අපි මිත්තණියන් **සමඟ** පන්සල් ගියෙමු.

ලබන කලබට

# න/ණ ල/ළ පැටලෙමුද? ගැලවෙමුද

න/ණ, ල/ළ වෙනස පිළිබඳ සතුටු විය හැකි අවබෝධයක් මට ඇතැයි මම සිතමි. එහෙත් එය 100% දැනුමක් නම් නො වේ. මගේ වයස අවුරුදු 50 දී එය 50 - 60% අතර මට්ටමක පවතින්නට ඇත. 60 දී එය 70-80% අතර පවතින්නට ඇත. දැන් එය 90% ට වැඩි මට්ටමක අතැයි මට සිතේ. කිසියම් උගතකු එය ඊට අඩු මට්ටමක පවතින බව කිව හොත් මම එය පිළිගනිමි.

අදින් වසර 10 කට පමණ පෙර සිට මා, දෙහිවළ, නාවළ, පින්නවළ, යක්කළ, නයිවළ ලියන්නේ මූර්ධජ ළ යන්න සහිතව ය.. ඊට කලින් කොහුවළ, මඩවළ, රතුපස්වළ, දෙදියවළ, කූඩලුවළ, දුම්මලවළ, ගොනාපීනූනළ වැනි නම් පමණෙකි මා වළ (ආවාටය) හැටියට ගණන් ගත්තේ. නාගොඩ, බෝගොඩ මෙන්ම නාවළ, බෝවළ, දෙල්වළ යන නම් එම ගස් සහිත පහත් බිමක්ය යනු මගේ විශ්වාසයයි. හෙලිකතුරකින් (හෙලිකොප්ටරයකින්) ගම්බද ප්‍රදේශයක අහසේ සැරි සරන විට තැනින් තැන ගස් සමූහ වශයෙන් (කැළෑ) වැවී තිබෙනු දත හැකි ය. වතුර රැස් වෙතත් තොවෙතත් පහත් බිම් වල තෙතමනය අධිකය. ඒ නිසා එබඳු පහත් බිම්වල (වළවල) ගස් කොළන් සරුවට වැඩේ. පින්නගස් බහුල වළ පින්නවළ ලෙසත්, කිරිල්ල ගස් බහුල වළ කිරිල්ලවළ ලෙසත්, කැන්ද ගස් බහුල වළ කැන්දවළ ලෙසත් හැඳින්වීම ගැමියාගේ සිරිතය. බෝ , නුග, නා, (බැදි) දෙල් වැනි ලොකු ගස් එකක් වුව ද ඒ ගසේ නමින් බෝවළ, නුගවළ, නාවළ, දෙල්වළ යනුවෙනි ඔහු හඳුන්වන්නේ. එය වළක් නොවේ නම් ගොඩ, යාය, කැළේ වැනි නමක් සහිතව හෝ විශේෂණයක් සහිතව බලබෝව, කොටබෝව, කොටකිතුල, කිතුල්කොටේ, හුළංනුගේ, බරවාකුඹුක, රතුකොහො (රතු කොස් ගස යන තේරුම ඇත) වැනි නමකින් ඒ ප්‍රදේශය හැඳින්වීම ඔහුගේ සිරිතයි.

ගමේ පන්සලේ හාමුදුරුවන්, වෙදුන්, කට්ටඬියන්, නැකැතියන්, මෙන් ම රජුන් හෝ ඇමතියන් මුල්වීමෙන් වුව ද ගමක නමක් ඇති විය හැකි ය. සමහරු පිටුපසින් අත යවා නාසය අල්ලන්නට තැත් කරති. කුණ්ඩසාලේ නමට දෙවියන් ගාවා දෙවියන්ගේ කුණ්ඩලාභරණය වැටුණු තැන කුණ්ඩසාලේ වූ බවට පවතින ජනප්‍රවාදය පන්සල් ආශ්‍රයෙන් ගෙතුණු රස කතාවකැයි සිතමි. රජ්ජුරුවන් කෙළි දෙළෙන්/විනෝදයෙන් කාලය ගත කිරීම සඳහා තෝරා ගත් තැන -සමහර විට තවත් හේතු තිබෙන්නට ඇත. රටේ සියලුම දේ රජු සන්තක වස්තු බව රහසක් නොවේ - ඉදි කැරුණු ශාලාවට කුණ්ඩසාලෙයි යන දෙමළ බසේ නම ව්‍යවහාර කරන ලදැයි කියති. මුන්නක්කරය, නල්ලතන්නිය එබඳු තවත් නම් දෙකකි.

මගේ ගුරුතුමා න/ණ, ල/ළ වෙනස තිබිය යුතු යැයි තරයේ විශ්වාස කළ කෙනෙකි. “***ගැටලු තැන් ඇති බව ඇත්තය.*** *(එතුමා ගැටලු ලීවේ ගැටළු යනුවෙනි. මා සිතන්නේ ගැට ලා පූ තැන යන තේරුම එහි ඇති බව යි)* ***එහෙත් එය රැක ගත යුතු ය. ගුරුළු ගෝමී, විදුසක්විති, පණ්ඩිත පරාක්‍රමබාහු, ශ්‍රී රාහුල හිමි ආදීන් එය පණ මෙන් ආරක්ෂා කළේ එය තිබිය යුතු නිසා ය. දැන් හැදෙන බක පණ්ඩිතයන්ට බරක් උණාට එහි බරක් අපට නැත.”*** මේ එතුමා දැරූ අදහසයි.

එතුමා තම අදහස සනාථ කිරීමට දැක් වූ නිදසුන් කොතරම් බොලඳ දැයි මට දැන් සිතේ.
පිස්සා තන/තණ කයි - සොරා වලේ/වළේ සැඟවිණි

මම මුසිලයකු වීමට අකමැති වෙමි. එහෙයින් මේ ප්‍රශ්න මම මගෙන් අසමි.

පිස්සා කන්නේ තන/තණ කොළ ද? තනයක් ද? ඒ තනය ගැහැනියකගේ ද? පිරිමියකු ගේ ද? එය පැළ මදයක් මෙන් කෑ හැකි ද? කනවාට වඩා විකනවා, සපනවා යන වචන ඊට සුදුසු නැද්ද? රිලා වඳුරු ආදීන්ට ඇත්තේත් තන නොවේ ද? දිගින් දිගටම මේ ගැන ප්‍රශ්න ඇසිය යුතු නැත. තන දෙකක් කන්නට පෙර පිස්සා ගේ දත් ඇඳි දෙක බඩට යා හැකි බැවිනි.

මගේ ගුරුතුමාගෙන් (අද එතුමා නැත) ඉගෙනගත් සිංහල දැනුමින් ඇසීමට මට ද ප්‍රශ්න දෙකක් ඇත. පා යනු පාද/පාත්‍ර යන තේරුමත් දන යනු ධනය/ජනයා යන තේරුමත් ඇති පද දෙකකි.

***තෙරුන් වහනේසේ ගඟට බැස පා/පය සෝදන සේක.***
***රජ්ජුරුවෝ නිති දන රකිති.***

මේ වැකි දෙකේ තෙරුන් වහන්සේ සෝදන්නේ පය ද? පාත්‍රය ද? රජ්ජුරුවන් රකින්නේ ධනයද? ජනයාද?

මගේ ගුරුතුමාගෙ කතෘවේ නොකියවුණු පැත්ත දැන් මට තේරේ. අවිරුදු කීපයක් දුක්විඳ මන්තර ඉගෙන ගත් යකදුරා යකුන් සිටින බව ඔප්පු කරන්නට නොගන්නා වෙහෙසක් නැත. ඔහු ගැහැනුන් බිය වද්දන කතා ගොතා කියනු ඇත. යකුන් නැති බව මිනිසුන් තේරුම් ගත් දාට ඔහුට හුළං බව ඔහු දනී.

***කලණි රේණුකා***
***පන්නළ තණ කොළ දෙණිය බුළුගහවළ***
යන ලිපිනය දන්තජ ම යොදා ලියා තිබුණොත් පන්ඩිතයකු ළඟට ගොස් එය න/ණ ල/ළ සහිත ව ලියවා ගෙන තේරුම් ගත යුතු ය.

භාෂාව කතා නොකරන්නේ බිලිඳෙකි. නැතහොත් ආබාධිතයෙකි. අද භාෂාව නොලියන්නේ ඒ දෙනොට අමතරව අකුරු සෑස්තරේ නොදන්නා කෙනෙකි. භාෂාව එක්තරා පිරිසකට - කුලයකට සීමා කළ නොහැකි ය. සමහර කුලවල ළමයින්ගේ පාසල් ගමන වැලැක් වූ ඇතැම් කුලවත් අදිපතීන් අපේ රටේ සිටි බව අසා ඇත්තෙමි. එය පාරක් වැනි ය. බස්, ලොරි, කාර්, ගැල්, තිවිහිල්, සයිකල් වැනි වාහන වලින් ගමන් කිරීම සඳහා හෝ බඩු ගෙන යෑම සඳහා එය අත්‍යවශ්‍ය ය.

පාර වළ ගොඩැලි, ගල්, මුල් විල්න් තොර වූ විට පාළම් බෝක්කු ශක්තිමත් වූ විට, යා හැකි වේගය වැඩි ය. ගෙන යා හැකි බර ද අධිකය. එය වාහනයේ ආරක්ෂාවට සහ පැවැත්මට ද ඉතා හොඳය. අද අප ජීවත්වන්නේ පරිගණක යුගයේ බව අපේ උගතුන් තේරුම් නොගැනීම අභාග්‍යයකි.

ඉතිරිය ලබන කලාපයේ

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න
මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243
Melbourne 03 9309 2427

Raigam
Satisfying your taste buds!
ඇයි මේ හැමෝම රයිගම් ඉල්ලන්නේ?
අපිට පුරුදු රස ගුණ හොඳින් හඳුනන රයිගම් නිෂ්පාදන මිලදී ගන්න දුර ගෙවාගෙන ගිහි අපි එන්නේ ඒ රයිගම් රස අපිත් හොඳින් දන්න නිසයි.
රස හඳුනන්නෝ රයිගම් ගන්නෝ
Raigam Soy, Raigam Noodles, Raigam Dehydrated Vegetables, Raigam Coffee
Raigam String Hopper Flour, Raigam Jayalanka Spice range, Raigam
NO ALTERNATIVE TO RAIGAM TASTE! IT'S IRRESISTIBLE!
For genuine export quality Raigam products, look for 'AU EXPORT' print & imported by 'E-Techno' label.
Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, PO Box 87, Moone Ponds Vic 3039
Wholesale & Customer Service 03-9700 2100/93703813
රයිගම් නම් කවදත් කොතැනත් හරිම රසයි!
New Stocks Avaialable, Enquire today for your stock!
Email:sales@etechno.com.au FAX -03-9337 9468